# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2303/54 – 2022 ඔක්තෝබර් මස 29 වැනි සෙනසුරාදා – 2022.10.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2021/26.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2022.09.01 වැනි දින අංක 2295/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.08.25 වැනි දින දරන නියෝගයෙන්,

එච්. පී. යූ. කේ. ද සිල්වා මයා, අංක 396/32, ගාලු පාර, තල්පිටිය දකුණ, වාද්දුව.

සහ

කොමුති ඉංජිනියරින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 595, නාවල පාර, රාජගිරිය.

අතර පවත්නා 2022.08.24 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ තම්බයියා පලනිවේලු පරමේස්වරන් මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතිඥ තම්බයියා පලනිවේලු පරමේස්වරන් මහතා ධුරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2022.08.25 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ දී ය.


1A – G 37900 – 14 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2021/26.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එච්. පී. යූ. කේ. ද සිල්වා මයා, අංක 396/32, ගාලු පාර, තල්පිටිය දකුණ, වාද්දුව.

සහ

කොමුති ඉංජිනියරින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 595, නාවල පාර, රාජගිරිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, යක්කල, ගම්පහ පාර, තැඹිලි කොටුව වත්ත, අංක 03, රමාල් අයි. සිරිවර්ධන මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2021/26.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්. පී. යූ. කේ. ද සිල්වා මයා, අංක 396/32, ගාලු පාර, තල්පිටිය දකුණ, වාද්දුව.

සහ

කොමුති ඉංජිනියරින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 595, නාවල පාර, රාජගිරිය.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''කොමුති ඉංජිනියරින් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් එහි සේවක එච්. පී. යූ. කේ. ද සිල්වා මහතාට මසකට දින 26/27 සම්පූර්ණ කළවිට ගෙවීමට එකඟව ඇති පැමිණීමේ දීමනාව හා ගමන් වියදම් දිරි දීමනාව 2019 ජනවාරි, අප්‍රේල් හා මැයි මාසයන් සඳහා ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10-0278

මගේ අංකය: IR/COM/01/2020/217.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

ලංකා වතු සේවා සංගමය, (ඩී. සෝමලිංගම් මයා වෙනුවෙන්), අංක 06, ඇලෝයි මාවත, කොළඹ 03.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

1. කොටගල ප්ලාන්ටේෂන්ස් පී එල් සී, අංක 53/1/1, සර් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.
2. ඇදුරගල වත්ත, ඉංගිරිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, ජී. එච්. පෙරේරා මාවත, අංක 43/1, නීතිඥ ටී. සී. ජේ. පීරිස් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2020/217.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ලංකා වතු සේවා සංගමය, (ඩී. සෝමලිංගම් මයා වෙනුවෙන්), අංක 06, ඇලෝයි මාවත, කොළඹ 03.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. කොටගල ප්ලාන්ටේෂන්ස් පී එල් සී, අංක 53/1/1, සර් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.
2. ඇදුරගල වත්ත, ඉංගිරිය.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''කොටගල ප්ලාන්ටේෂන්ස් සමාගමට අයත් ඇදුරගල වතුයායෙහි ලොරි රථ රියදුරු වශයෙන් සේවය කළ ඩී. සෝමලිංගම් මහතාට විශ්‍රාම යාමෙන් පසු එම වතුයායෙහිම නැවත කොන්ත්‍රාත් සේවකයෙකු වශයෙන් සේවය කල වසර 7 තුළ, පළමු වසර 4 සඳහා වෛද්‍ය ආධාර මුදල් ගෙවීම් කර අවසන් වසර 3 සඳහා එම වෛද්‍ය ආධාර මුදල් නොගෙවීමත්, මඟින් එම මහතාට අසාධාරණයක් සිදුව තිබේ ද? එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඒ මහතාට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10-0279

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.